Article

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 19th July 2021 |

පැමිණිලිකරු : බී.එච්.ජී.එච්.ගාමිණී මතුරට මහතා,
අංක : 33/6, වීරවික්‍රම පාර,
ආඩිඅම්බලම, කටුනායක.

වගඋත්තරකරුවන් :

1. ලේකම්,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ 01.

2. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ.

3. ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය,
කොළඹ 01.

<u>පැමිණිලි අංකය : **HRC/3346/16**</u>

**පැමිණිලිකරුගේ කරුණු දැක්වීම :**

පැමිණිලිකරු 1980 අප්‍රේල් මස 16 වන දින පොලිස් දෙපාර්තමේන්තුවට බැඳී 1997 වසරේදී සහකාර පොලිස් අධිකාරිවරයෙකු ලෙසින් උසස්වීම් ලැබ, 2016 වසරේ අගෝස්තු මාසයේදී විශ්‍රාම ලැබූ බව දක්වා ඇත.

තමා ගල්ගමුව පොලිස් ස්ථානයේ සේවය කල කාලය තුළ එහි සේවය කල උප පොලිස් පරීක්ෂකවරයෙකු වූ රංග බණ්ඩාර නම් අයෙකු විසින් සිදුකරනු ලැබූ අත්අඩංගුවට ගැනීම් හා අතුරුදහන්වීම් කිහිපයක් සම්බන්ධයෙන් වූ අධිකරණමය නඩු කටයුතු සම්බන්ධයෙන් තමා ද වගඋත්තරකරුවකු ලෙස නම් වී සිටීම තුළ තමාට නියමිත උසස්වීම වන සහකාර පොලිස් අධිකාරි තනතුර නියමිත අවස්ථාවේ නොලැබුනු බවත්, එමෙන්ම ඉහත නඩු වලින් තමා නිදොස් කොට නිදහස්වූ පසුද නියමිත දිනට උසස්වීම් නොලද බවත්, කෙසේ වෙතත් සහකාර පොලිස් අධිකාරි ධූරයට උසස්වීම් ලද දිනයේ සිට තමා විශ්‍රාම ගැන්වූ දිනය දක්වා කාලය වසර 17 ක් වන බවත් දක්වා ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.
සභාපති / தவிசாளர் } 011-2505451
ෆැක්ස් / தொலைநகல் } 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் } sechrc@gmail.com

තමා සහකාර පොලිස් අධිකාරි තනතුරට පත් වී ගෙවුනු වසර 17 ක සේවා කාලය තුළ තමාට 1999 ඔක්තෝම්බර් 08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 අනුව සහ 2016 වසරට අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 (xxxii) 2016.06.24 දිනැති චක්‍රලේඛ ප්‍රකාරව වසර 05 කට වරක් තීරු බදු රහිත වාහන බලපත්‍රයක් ලබාගැනීමට ඇති බවත්, නමුත් තමාට එක් බලපත්‍රයක් පමණක් ලැබුනු බවත්, එම බලපත්‍රය ලැබී තමා විශ්‍රාම යන අවස්ථාව වනවිට වසර 5 ක් සම්පූර්ණ වී නොතිබීම හේතුවෙන් තමාට තවත් බලපත්‍රයක් ලබානොදුන් බවත්, ඒ සඳහා දින 36 ක අඩුවීමක් පමණක් පැවති බවත් දක්වා ඇත.

එසේම, තමාට තීරුබදු සහන සහිත වාහන බලපත්‍රය ලබාදෙන ලෙස පොලිස් දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කොට ඇති බවත්, නමුත් මුදල් අමාත්‍යාංශය විසින් මේ දක්වා තමාට හිමි අයිතිවාසිකම් අහිමි කොට ඇති බවත් වැඩිදුරටත් දක්වා ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :**

**පළවන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :**

සේවයේ නියුතු රාජ්‍ය නිලධාරින් සඳහා සහනදායි මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම පිණිස වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2007, 01/2010 සහ 01/2013 යන චක්‍රලේඛයන් ක්‍රියාත්මකව පැවති බවත්, මේවනවිට අංක 01/2016 චක්‍රලේඛනය ක්‍රියාත්මකව පවතින බවත්ය.

ඒ අනුව 01/2007, 01/2010 සහ 01/2013 යන චක්‍රලේඛ මඟින් සුදුසුකම් ලබන නිලධාරින්ට සෑම වසර 05 කට වරක් සහනදායි මෝටර් රථ බලපත්‍රයක් ලබාගැනීමේ හැකියාව පැවති බවත්, නමුත් මේවනවිට එම චක්‍රලේඛයන් අහෝසි කොට ඇති බවත්, දැනට ක්‍රියාත්මක වන්නේ 01/2016 චක්‍රලේඛනය බවත්, ඒ යටතේ සේවයේ නියුතු රාජ්‍ය නිලධාරියෙකුට උපරිම වශයෙන් හිමිවන්නේ බලපත්‍ර දෙකක් පමණක් බවත්, එසේම එවැනි නිලධාරියෙකු තම පළමු බලපත්‍රය ලබා වසර 10 ක් ඉක්මවූ පසු සිය දෙවන බලපත්‍රයට හිමිකම් කියන බවත් දක්වා ඇත.

ඒ අනුව පැමිණිලිකරු 22/99 චක්‍රලේඛනය ප්‍රකාරව පළමු බලපත්‍රය 2011 වසරේදී ලබා ඇති බවත්, ඔහු විශ්‍රාම ලබන අවස්ථාව වනවිට පළමු බලපත්‍රය ලබා වසර 05 ක් සම්පූර්ණ වී නොමැති බවත්, ඒ අනුව ඔහුට නැවත බලපත්‍රයක් ලබාගැනීමට හිමිකමක් නොපවතින බවත් වැඩිදුටත් දක්වා ඇත.

**දෙවන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :**

දෙවන වගඋත්තරකාර පොලිස්පතිතුමා වෙනුවෙන් කරුණු දක්වමින්, දෙපාර්තමේන්තු මට්ටමින් සිදුකළ යුතු සියළු කාර්යයන් කිරීමෙන් අනතුරුව පැමිණිලිකරුට ඔහුගේ පාලනයකින් තොරව සිදුවී ඇති

තත්ත්වයක් යටතේ තීරුබදු සහන සහිත වාහන බලපත්‍රයක් ලබාගැනීමට ඇති හිමිකම නිර්දේශ කරමින් මුදල් අමාත්‍යාංශය වෙත අවශ්‍ය සියළු නිර්දේශයන් යොමු කොට ඇති බවයි. ඒ අනුව දෙවන වගඋත්තරකරු පැමිණිලිකරුගේ පැමිණිල්ල මඟින් අයැද ඇති සහනයන් ලබාදීම සම්බන්ධයෙන් විරෝධතාවයක් නොදක්වන බව අනාවරණය වී ඇත.

**නිරීක්ෂණ :**

පැමිණිලිකරු 1980.04.16 දින උප පොලිස් පරික්ෂකවරයෙකු පොලිස් දෙපාර්තමේන්තුවට සේවයට බැදී ඇත.

1997 වසරේදී සහකාර පොලිස් අධිකාරි ලෙස උසස්වීම් ලබා ඇති අතර, සහකාර පොලිස් අධිකාරි ධූරයට උසස්වීම් ලද දිනයේ සිට පැමිණිලිකරු විශ්‍රාම ලබන දිනය දක්වා පැමිණිලිකරුගේ මුළු සේවා කාලය වසර 17 ක් වන බවට කරුණු ඉදිරිපත්වී ඇත.

පැමිණිලිකරුගේ මූලික කරුණු දැක්වීම වනුයේ ඉහත සඳහන් වසර 17 ක සේවා කාලය තුළ තමාට එවකට ක්‍රියාත්මකව පැවති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන ප්‍රකාරව තීරු බදු සහන සහිත මෝටර් රථ බලපත්‍ර 03ක් ලබාගැනීමේ හිමිකම පවතින බවයි.

නමුත්, මෙම වසර 17 ක කාලය තුළ පැමිණිලිකරුට එරෙහිව අධිකරණමය නඩු කිහිපයක් විභාග වී ඇති බවත්, නඩු විභාගය අවසානයේදී පැමිණිලිකරු නිදොස් කොට නිදහස්වී ඇති බවත්, නමුත් නිදොස් කොට නිදහස්වීමේ නඩු තීන්දුව ලබාදෙනතුරු දක්වා කාලය තුළ පැමිණිලිකරුට වාහන බලපත්‍රයක් ලබාගැනීමේ හිමිකම නිත්‍යානුකූලව නොපැවතීම හේතුවෙන් එම කාලය තුළ නියමිත ආකාරයෙන් පැමිණිලිකරුට හිමිවිය යුතු (වසර පහෙන් පහට ලැබිය යුතු) බලපත්‍ර අහිමි වී ඇති බවටත් කරුණු අනාවරණ වේ.

පැමිණිලිකරු අධිකරණය මඟින් නිදොස් කොට නිදහස්වීමෙන් පසු ඔහුගේ පළමු වාහන බලපත්‍රය 2011 ජුලි 04 වන දින අනුමත කොට ඇති බවත් අනාවරණය වේ.

පැමිණිලිකරු 2016 අගෝස්තු මාසයේදී රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබා ඇති අතර, විශ්‍රාම ලබන දිනය වනවිට පළමු තීරුබදු සහන සහිත වාහන බලපත්‍ර ලබා වසර 05 ක කාලයක් සම්පූර්ණ වී නොමැත.

පැමිණිලිකරුට 1997 වසරේදී සහකාර පොලිස් අධිකාරි ලෙස උසස්වීම් ලැබීමෙන් පසු 2011 වසර දක්වා වන වසර 14 ක පමණ කාලයක් තුළ ඔහුට එරෙහිව අධිකරණය හමුවේ නඩු කටයුතු විභාග වෙමින් පැවතීම තුළ එම කාලය තුළ තීරු බදු සහන සහිත වාහන බලපත්‍රයක් ලබා ගැනීමේ නෛතිකමය හැකියාවක් නොපැවතීම තුළ ද, ඒ සඳහා පැමිණිලිකරු අයදුම් කොට ඇති බවත් නිරීක්ෂණය වේ.

කෙසේ වෙතත්, පැමිණිලිකරු අධිකරණය මඟින් නිදොස් කොට නිදහස්වීමෙන් පසුව ගෙවුනු වසර 14ක පමණ කාලය තුළ තමාට හිමිවිය යුතු බලපත්‍ර ලබාගැනීමට අයදුම් කොට ඇති බව තහවුරු කිරීමට අවශ්‍ය සාක්ෂි ලේඛන ඉදිරිපත් කොට නොමැත.

එසේම, 2011 ජූලි මස 04 වන දින පැමිණිලිකරුගේ පළමු බලපත්‍රය අනුමත වීමෙන් පසුව ද, අධිකරණයේ නඩු කටයුතු විභාග වෙමින් පැවති කාලය තුළ තමාට හිමිවිය යුතු බලපත්‍ර ලබා ගැනීමට යොමු කළ අභියාචනා හෝ අයදුම්පත්‍ර සාක්ෂි ලේඛන ලෙස මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කොට නොමැත.

පැමිණිලිකරු නියත වශයෙන්ම 2016 වසරේදී විශ්‍රාම ලබන අවස්ථාවේදී තම දෙවන බලපත්‍රය ලබාගැනීම සඳහා අයදුම් කොට ඇති බවත් නිරීක්ෂණය වන අතර, නමුත් එම අවස්ථාවේදී පළමු බලපත්‍රය ලැබී වසර 05 ක් සම්පූර්ණ වී නොමැති බව නිරීක්ෂණය වේ.

එසේම එම අවස්ථාව වනවිට එනම්, පැමිණිලිකරු විශ්‍රාම ලබන 2016 අගෝස්තු මාසය වනවිට එතෙක් ක්‍රියාත්මකව පැවති චක්‍රලේඛ 01/2007 , 01/2010 සහ 01/2013 චක්‍රලේඛන අහෝසි කොට ඇති අතර, ඒ වනවිට ක්‍රියාත්මකව ඇත්තේ 01/2016 චක්‍රලේඛනය බව අනාවරණය වේ.

01/2016 චක්‍රලේඛනය ප්‍රකාරව සේවයේ නියුතු රාජ්‍ය නිලධාරියෙකුට උපරිම හිමි වන්නේ බලපත්‍ර දෙකක් පමණක් වන බවත්, ඒ අනුව සේවයේ නියුතු නිලධාරියෙකු තම පළමු බලපත්‍රය ලබා වසර 10ක් ඉක්මවූ පසු සිය දෙවන බලපත්‍රය සඳහා සුදුසුකම් ලබන බවත් නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු තමා ලද බලපත්‍රයට අමතරව තවත් බලපත්‍රයකට හිමිකම සඳහා අයදුම් කරනු ලබන්නේ ඔහුගේ විශ්‍රාම ගැන්වීම සිදුවන අවස්ථාවේදී වන බවට කරුණු නිරීක්ෂණය වේ. පැමිණිලිකරු විශ්‍රාම ගනු ලබන අවස්ථාව වනවිට එතෙක් පැවති චක්‍රලේඛන අහෝසි කොට 2016.0.1 දින නව චක්‍රලේඛනයක් නිකුත් කොට ඇත. එම චක්‍රලේඛනය ප්‍රකාරව පැමිණිලිකරුට ඔහුගේ පළමු බලපත්‍රය ලැබීමෙන් වසර 10 කට පසුව පමණක් තවත් බලපත්‍රයකට හිමිකම් ලැබෙන බව අනාවරණය වේ.

කෙසේ වෙතත් මෙහිදී අවධානය යොමු කළ යුතු කරුණ වනුයේ 1997 වසරේ සිට 2011 වසර දක්වා එනම්, පැමිණිලිකරුට එරෙහිව අධිකරණමය ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන ලද කාලය තුළ ඔහුට හිමිවිය යුතු වාහන බලපත්‍රය ලබානොදීම සම්බන්ධ කාරණය වන අතර, එවකට ක්‍රියාත්මකව පවතින චක්‍රලේඛන ප්‍රකාරව පැමිණිලිකරුට සෑම වසර 05කට වරක් නව බලපත්‍රයක් අයදුම් කිරීමේ නෛතිකමය හැකියාව ඇත. නමුත්, ඒ සම්බන්ධයෙන් පැමිණිලිකරු අයදුම් කොට ඇති බවක් කොමිෂන් සභාව හමුවේ නිරීක්ෂණය වී නොමැත.

2016 ජුලි මාසය තුළ එතෙක් පැවති චක්‍රලේඛන අහෝසි කොට නව චක්‍රලේඛන නිකුත් කිරීමෙන් පසුව පැමිණිලිකරු පැරණි චක්‍රලේඛන යටතේ හිමිකම් ඉල්ලා සිටීම කොමිෂන් සභාව හමුවේ නිරීක්ෂණය වේ.

**නිගමනය :**

පැමිණිලිකරු සිය පළමු වාහන බලපත්‍රය 2011 වසරේදී ලබා 2016 වසරේදී විශ්‍රාම ලබන අවස්ථාවේදී ක්‍රියාත්මකව පවතින නව චක්‍රලේඛ ප්‍රකාරව වසර 10 ක් සම්පූර්ණ නොවීම මත තවත් බලපත්‍රයක් අයදුම් කිරීමේ නෛතිකමය හැකියාව නොපැවතිය ද, 1997 වසරේ සිට 2011 වසර දක්වා වසර 14ක පමණ කාලයක් තුළ පෝෂ්‍ය විධායක ශ්‍රේණියේ නිලධාරියෙකු ලෙස හිමිකම් පෑමට අයිතියි ඇති වාහන බලපත්‍රය ඔහුගේ පාලනයෙන් තොර ක්‍රියාවක් හේතුවෙන් අහිමි වී ඇති බවත්, එතෙක් පැවති සියළු අධිකරණමය නඩු සම්බන්ධයෙන් වන අධිකරණමය තීරණය මගින් පැමිණිලිකරු නිදොස් කොට නිදහස් කර තිබීම හේතුවෙන් ද එවකට පැවති චක්‍රලේඛ ප්‍රකාරව පැමිණිලිකරුට තීරු බදු සහන සහිත වාහන බලපත්‍ර ලබාගැනීමේ හිමිකම් පවතින බවට නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව පැමිණිලිකරු වෙත තීරු බදු සහන සහිත වාහන බලපත්‍රයක් ලබාගැනීමට හිමිකම පවතින අතර, එම හිමිකම පැමිණිලිකරු වෙත ලබාදීමට කටයුතු කරන ලෙසට මෙයින් නිර්දේශ කර සිටිමු.

2021. 08.19 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ම.හේ. නිමල් කරුණාසිරි,
Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ස/-